**වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**
**----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**---------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**------------------------------**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 30 දින විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ඔක්තෝබර් 31 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**-----------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**-----------------------------------------**

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**
**------------------------**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

### 1.4 අසම්භාව්‍ය බැරකම්
**----------------------**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරී |
|---|---|---|---|
| (අ) | හෙළිදරව් කිරීම තහවුරු කිරීම සඳහා ගොඩනැගිලි අනුමැතිය ලබා නොදීම සම්බන්ධයෙන් සභාවට එරෙහිව අධිකරණයේ 2018 මැයි 23 දින සිට අංක 2385/18 දරන නඩුව විභාග වෙමින් පැවැතීම නිරීක්ෂණය විය. එසේ වුවත්, මේ සඳහා වියදම් අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | නඩු වියදම් අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුවේ. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශනවල දක්වනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අදාළ ඇතැම් පාර්ශව විසින් ප්‍රාදේශීය සභාවට ලබා දී තිබූ ඉඩම් සම්බන්ධයෙන් සභාවට විරුද්ධව අධිකරණයේ 2018 මාර්තු 29 දින සිට අංක 51/13 දරන නඩුව විභාග වෙමින් පැවැති අතර මේ සඳහා වියදම් අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | නඩු වියදම් අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුවේ. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශනවල දක්වනු ලැබේ. |
| (ඇ) | මාළු වෙළඳපොල ඉඩම බදු දීම් සම්බන්ධයෙන් සභාවට එරෙහිව අධිකරණයේ 2015 අගෝස්තු 24 දින සිට අංක ඉඩම්/02/2015 දරන නඩුව විභාග වෙමින් පැවැති අතර මේ සඳහා වියදම් අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | නඩු වියදම් අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුවේ. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශනවල දක්වනු ලැබේ. |
| (ඇ) | සත්ව සාතනයට එරෙහිව සභාවට විරුද්ධව අධිකරණයේ 2017 දෙසැම්බර් 12 දින සිට අංක 171/2017 දරන නඩුව විභාග වෙමින් පැවැති අතර මේ සඳහා වියදම් අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | නඩු වියදම් අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුවේ. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශනවල දක්වනු ලැබේ. |
| (ඉ) | මාළු වෙළඳපොල ඉඩම් බදු දීම් සම්බන්ධයෙන් සභාවට එරෙහිව අධිකරණයේ 2018 පෙබරවාරි 22 දින සිට අංක ඉඩම්/373/2018 දරන නඩුව විභාග වෙමින් පැවැති අතර මේ සඳහා වියදම් අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | නඩු වියදම් අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුවේ. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශනවල දක්වනු ලැබේ. |

## 1.5 අනුකූල නොවීම

### 1.5.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තිය | වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වේ. | වාර්තාව සකස් කර තිබූ නමුත් දෝෂයකින් මූල්‍ය ප්‍රකාශන සමඟ අමුණා නොතිබුණි. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 158 වගන්තිය | රු.42,615,065 ක් වටිනා හිඟ වරිපනම් බදු ගෙවීම පැහැර හැරි පුද්ගලයන්ට සභාපතිවරයා විසින් වරෙන්තු නිකුත් කර නොතිබුණි. | අදාළ පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වේ. | ඉදිරි කාලවලවී හිඟ ලැයිස්තු පිළියෙල කර වරෙන්තු නිවේදන නිකුත් කෙරේ. |
| (ඇ) | 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති | | | |
| | X පරිච්ඡේදයේ 193 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් පිළිබඳ විස්තර අයවැය ඇස්තමේන්තුව සමඟ සසඳා විචලනයන් සඳහා පැහැදිලි කිරීම් ඇතුළත් ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි. | නියමිත රීතින්වලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | ප්‍රවර්තන වර්ෂයේ සිට ගිණුම් ප්‍රකාශන සමග පැහැදිලි කිරීම් ඇතුළත් ප්‍රකාශය අමුණනු ලැබේ. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වර්ෂ දෙකක් ඉක්ම වූ රු.1,237,247ක් වටිනා තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | නියමිත මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | අදාළ අයට ලිපි හා සිහි කැඳවීම් ලිපිය යවනු ලැබේ. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 74,743,374 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 25,785,467 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 9,339,672 | - | 9,455,490 | 9,945,885 | 2,186,955 | - | 2,260,298 | 5,338,480 |
| කුලී | 11,253,600 | - | 52,024,138 | 11,733 | 12,719,392 | - | 10,924,286 | 22,473 |
| බලපත්‍ර ගාස්තු | 1,852,500 | - | 2,006,506 | 24,000 | 1,820,000 | - | 1,882,427 | 15,500 |
| වෙනත් ආදායම් | 67,434,237 | - | 80,453,581 | 32,799,789 | 6,999,772 | - | 70,322,151 | 69,474,679 |
| | 9,339,672 | - | 9,455,490 | 9,945,885 | 2,186,955 | - | 2,260,298 | 5,338,480 |
| එකතුව | **89,880,009** | **-** | **143,939,715** | **42,781,407** | **84,726,119** | **-** | **85,389,162** | **74,851,132** |

* බිල් කළ ආදායම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පසුගිය වර්ෂ 5කට අධික කාලයක සිට ආදායම් බිල් නොකිරීමෙන් අදාළ ආදායම් රැස්කිරීමේ අකාර්යක්ෂමතාවය හෙළිදරව් කර තිබුණි. | බිල් කළ ආදායම් තහවුරු කළ යුතු වේ. | ඉදිරියේදී ආදායම් බිල් කර අයකිරීමට කටයුතු කරනු ලැබේ. |

### 2.2.3 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ හිඟ වරිපනම් බදු රු.42,615,065 ක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | සියළුම හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් අය කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ හිඟ ජල බදු රු.294,430 ක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | සියළුම හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රවර්තන වර්ෂයේ අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

**2.2.4 බලපත්‍ර ගාස්තු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ හිඟ ව්‍යාපාර බලපත්‍ර ගාස්තු රු.14,000 ක් අයකර ගැනීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි. | සියළුම හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

**2.2.5 උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු**

**උසාවි දඩ මුදල්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ මුදල් රු.1,321,786 ක් සහ මුද්දර ගාස්තු රු.29,830,508 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ උසාවි දඩ මුදල් මුදල් සහ හිඟ මුද්දර ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතු වේ. | දඩ මුදල් අයකිරීමට කටයුතු කෙරේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව මූලික කරුණු 30ක් පිළිබඳව අතුරු | සියළුම කරුණු සඳහා අතුරු ව්‍යවස්ථා සකස් කළ යුතු වේ. | අනෙකුත් විෂයයන් සඳහා අතුරු ව්‍යවස්ථා ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු කරනු |

| | | |
|---|---|---|
| ව්‍යවස්ථා ක්‍රියාත්මක කළ යුතු වුවත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් මූලික කරුණු 06ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා සකස් කර තිබුණි. | | ලැබේ. |

(ආ) **ක්‍රියාකාරී සැලැස්ම**

| **විගණන නිරීක්ෂණ** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 30 ක් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | සියළුම ක්‍රියාකාරකම් සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. | ප්‍රවර්තන වර්ෂයේ සිට සිදු කරනු ලැබේ. |

(ඇ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | **විගණන නිරීක්ෂණ** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (i) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා සභාව විසින් ක්‍රියාත්මක කළ දිගුකාලීන හා කෙටිකාලීන ව්‍යාපෘති සඳහා සමාලෝචිත වර්ෂයේ රු. 507,372ක් වැයකර තිබුණත් සභාවේ ආදායම් ලෙස රු. 259,900ක් පමණක් උපයාගෙන තිබුණි. | ආදායම් වැඩිකර ගැනීමටත් වියදම් අවම කර ගැනීමටත් කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |
| (ii) | ඝන අපද්‍රව්‍ය කාර්යයන්වල යොදවනු ලබන සෞඛ්‍ය කම්කරුවන්ට කාලයෙන් කාලයට සිදු කළ යුතු වෛද්‍ය පරීක්ෂණයන් සභාව විසින් පවත්වා නොතිබුණි. | සෞඛ්‍ය කම්කරුවන්ට කාලයෙන් කාලයට සිදු කළ යුතු වෛද්‍ය පරීක්ෂණයන් සිදු කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |
| (iii) | ඝන අපද්‍රව්‍ය රැස්කිරීම සඳහා නිශ්චිත ප්‍රදේශයක් තෝරාගෙන තිබුණද, ජාතික ප්‍රතිපත්ති ප්‍රකාරව ඝන අපද්‍රව්‍ය වෙන් | ජාතික ප්‍රතිපත්ති ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුවේ. | |

කිරිමකින් තොරව රැස් කරනු ලබන අතර ගිනි තබනු ලබන බව නිරීක්ෂණය විය. එසේම කසළ බැහැර කරනු ලබන ස්ථානවල දෛනිකව රැස්කෙරෙන කසළ කැබැලි කර පස් දමා වසා නොතිබුණි.

**(ඉ) පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා තෝරාගෙන තිබූ ප්‍රදේශයේ මැසි මදුරුවන් බෝවීම මර්ධනය සඳහා මැසි තෙල් ඉසීම සහ දූර්ගන්ධය වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මැසි තෙල් ඉසීම සහ දූර්ගන්ධය වැලැක්වීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් රු. 86,226,540ක් වටිනා අරමුදල් සභා බලප්‍ර දේශයේ සංවර්ධන අවශ්‍යතා සඳහා උපයෝජනය ස්ථාවර තැන්පතු පෙස පවත්වාගෙන ගොස් තිබුණි. | නිෂ්චිත අරමුණු සඳහා උපයෝජනය කළ යුතු වේ. | ප්‍රවර්තන වර්ෂයේ එම කාර්යයන් ක්‍රියාත්මක කෙරෙමින් පවතී. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් මානව සම්පත් ලබාගෙන යොදවා නොතිබු බැවින්, එවැනි මානව සම්පත් 16 ක් විසින් නිම කළයුතු කාර්යයන් ප්‍රමාදවී තිබූ බව නිරීක්ෂණය විය. | අනුමත කළ සංඛ්‍යාවට සමාන සේවක සංඛ්‍යාවක් පත් කර ගත යුතු වේ. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් සේවකයන්ට ගෙවිය යුතු රු.608,806 ක් වටිනා ගෙවීම් 27 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | සේවකයන්ට ලබාදිය යුතු ගෙවීම් නියමිත කාලයේ ගෙවිය යුතු වේ. | තැන්පතු නිරවුල් කිරිමට ක්‍රියාමාර්ග ප්‍රවර්තන වර්ෂයේ ගනු ලැබේ. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 පවරා නොගත් වත්කම්**

| | විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | පවරා නොගත් රු.22,355,483 ක් වටිනා දේපල 27 ක් සභාවේ නමට අයිතිය මාරු කර නොතිබුණි. | දේපලවල අයිතිය මාරු කිරිමට කටයුතු කළ යුතු වේ. | සභා තීරණ ලබාගැනීමෙන් පසුව ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (ආ) | සභාවේ භාවිතයේ පැවති වාහන 03 ක් මේ දක්වා පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහනවල අයිතිය මාරු කළ යුතු වේ. | අයිතිය සම්බන්ධ ලිපි ලේඛන නොලැබීම නිසා අයිතිය මාරු කිරීම කළ නොහැකි වී ඇත. |

**3.5.2 නිෂ්කාර්ය වත්කම්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අංක 252-6540 දරන පිකප් වාහනය සහ WPHO 0557 දරන ට්‍රැක්ටර් වතුර බවුසරය වර්ෂ 04 සිට වර්ෂ 16 ක් දක්වා භාවිතා නොකර තිබුණි. | අදාල වාහන සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | පිකප් වාහනය අලුත්වැඩියා කළ යුතු අතර, ට්‍රැක්ටර් ජල බවුසරය සඳහා අයිතිය පිලිබඳ ලිපිලේඛන නොලැබීම නිසා අයිතිය මාරු කිරීම කළ නොහැකි වී ඇත. |

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ සේවක වැටුප් අහිතකරවත් අනෙකුත් වියදම් හිතකරවත් පැවතුණි. | අයවැය නිවැරදි අයුරින් සැලසුම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | ඉදිරි කාලයේදී අයවැය ඇස්තමේන්තුව හැකි පරිදි තථ්‍ය වියදම් සමඟ එකඟ වන ආකාරයට සකස් කරනු ලැබේ. |